# A Comparative Study of Yōgāchāra Tri:svabhāva Concept and along with Early Buddhist Teachings

## යෝගාචාර ත්‍රි:ස්වභාව සංකල්පය හා ආදි බෞද්ධ ඉගැන්වීම් අතර තුලනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

ඓතිහාසික ලිඛිත මූලාශ්‍රය අනුව දෙවන ධර්ම සංගීයෙන් පසුව සංඝ සමාජය ථෙරවාද, මහාසාංඝික වශයෙන් ද්විපාර්ශ්වයක් වූ අතර, පශ්චාත්කාලීන සංවර්ධනයත් සමඟ මහාසංඝික සම්ප්‍රදාය මහායානය බවට පත්විය. මහායාන සම්ප්‍රදාය තුළ අනුශාඛා කිහිපයකි. ඉන් යෝගාචාර සම්ප්‍රදාය ප්‍රමුඛ වූ ගුරුකුලයක් ලෙස සංවර්ධනයට පත් වී ඇති බව බොහෝ විද්වත් මතයයි. යෝගාචාරීන්ගේ ධර්ම විග්‍රහය තුළ හමුවන ත්‍රිඃස්වභාව සංකල්පය තුළ "පුද්ගල ප්‍රත්‍යක්ෂය" පිළිබඳ සංක්ෂිප්ත ගැඹුරු වූ විග්‍රහයක් දැකගත හැකි ය. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් එකී සංකල්පය ආදි බෞද්ධ ඉගැන්වීම් හා තුලනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. ලු

යෝගාචාර විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය තුළ උක්ත ඉගැන්වීම ***"යෙන යෙන විකල්පෙන යද් යද් වස්තු විකල්ප්‍යතෙ පරිකල්පිත එවාසෞ ස්වභාවො න ස විද්‍යතෙ" "පරතන්ත්‍රස්වභාවස් තු විකල්පඃ ප්‍රත්‍යයොද්භවඃ නිෂ්පන්නස් තස්‍ය පූර්වේණ සදා රහිතතා තු යා"*** යනුවෙන් ත්‍රයාකාරව දක්වා ඇත. එනම්, "පරිකල්පිත" "පරතන්ත්‍ර" හා "පරිනිශ්පන්න" ස්වභාවයන් ය. මෙහි පරිකල්පිත ස්වභාවය යනු ලෝකයෙහි පවත්නා වස්තු පිළිබඳ සත්‍ය අවබෝධ නොකළ සත්වයන් විසින් තම සිතෙහි මවාගනු ලබන විකල්පිත වූ අවස්ථාවකි. පුද්ගලයා තම තමන්ට ආවේණික වූ සිතුම්, පැතුම් අනුව තමන් අරමුණු කරන ලෝකය පිළිබඳ සංකල්ප නිර්මාණය කරගනු ලබයි. මෙකී විග්‍රහය ආදි බෞද්ධ ඉගැන්වීම්හි හමුවන ම.නි. මධුපිණ්ඩික සූත්‍රාගත ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය හා සම්බන්ධ විග්‍රහය හා බොහෝ සෙයින් සමාන වූවකි. එසේම ''පරතන්ත්‍ර ස්වභාවය'' යනු පරිකල්පිත ලෝකය පිළිබඳව සාමාන්‍ය පුද්ගලයෙකු දකින තත්ත්වයට වඩා නුවණින් දැකීමෙන් පහළ කරගන්නා සිතුවිලි ය. මෙය ප්‍රත්‍යක්ෂයෙන් උපදින විකල්පයක් බව විඥානවාදීහු දක්වති. නමුත් පරතන්ත්‍ර අවස්ථාවේදී ද ලෝකය පිළිබඳ යථාර්ථය පිළිබිඹු නොවන බව යෝගාචාර මතයයි. මෙය ආදි බෞද්ධ ඉගැන්වීම් තුළ දැක්වෙන නාම-රූප විග්‍රහය තුළ ප්‍රකට වන බව පිළිගත හැක. යෝගාචාරීන්ගේ යථාර්ථ දර්ශනය ප්‍රකට වන්නේ පරිනිෂ්පන්න ස්වභාවය තුළ ය. එය "තථතාවය" ලෙසින් ඔවුන් දක්වා ඇත. යථාර්ථ දර්ශනය පිළිබඳ යෝගාචාර සම්ප්‍රදායානුගත විග්‍රහය හා සැසඳීමේ දී ආදි බෞද්ධ ත්‍රිලක්ෂණ විග්‍රහය යම් සමගාමී බවක් දක්වනු ලබන බව සිතිය හැක. නමුත් එහි සංකල්ප විග්‍රහය තුළ ඇත්තේ ද්විත්ව ස්වරූපයකි. මෙකී ධර්ම විග්‍රහයන් තුළ දැකගත හැකි සම විෂමතා මූලාශ්‍රය පදනම්ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය තුළ සිදුව ඇත.

ප්‍රමුඛ පද ඃ පරිකල්පිත ස්වභාව, පරතන්ත්‍ර ස්වභාව, පරිනිෂ්පන්න ස්වභාව, ප්‍රත්‍යක්ෂය.